www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ඉහලම ජෙනරාල් ජනාධිපති අපේක්ෂයකු ලෙස තොරොම්බල් කෙරෙයි

## Top Sri Lankan general touted as presidential candidate

කේ. රත්නායක විසිනි
2009 නොවැම්බර් 19

ශ්‍රී ලංකාවේ හිටපු යුද හමුදාපති සහ ආරක්ෂක මාන්ඩලික ප්‍රධානි සරත් ෆොන්සේකා වියහැකි ජනාධිපති අපේක්ෂකයකු ලෙස මතුවීම, මැයි මාසයේ දී රටේ දිග්ගැසුනු සිවිල් යුද්ධය අවසාන වීමෙන් අනතුරුව ආාන්ඩුව හා විපාර්ශ්වික පක්ෂ යන දෙපාර්ශ්වයම වෙලාගෙන ඇති තියුනු දේශපාලන අර්බුදය අවධාරනය කර තිබේ.

පිරිහෙන ආර්ථික තත්වය සහ බඩු මිල ඉහල යාම සහ වැඩෙන විරැකියාව සම්බන්ධයෙන් වැඩෙන සමාජ අසහනය මධ්‍යයේ, ජනාධිපති මහින්ද රාජපක්ෂ, ආාන්ඩුවේ පදනම් ශක්තිමක් කරගැනීමේ ප්‍රයත්නයක් ලෙස යුද ජයග්‍රහනය සැමරීමේ උත්සව දින නියමයක් නැතිව අඛන්ඩව පවත්වාගැනීමේ උත්සාහයක යෙදී ඇත. මෙම ජයොන්මාදය මධ්‍යයේ, රාජපක්ෂ දැවැන්ත බහුතරයකින් පලාත් සභා මැතිවරන මාලාවක් ම ජයගෙන සිය සභාගය ලබන අප්‍රේල් මස පැවැත්වීමට නියමිත මහ මැතිවරනයෙන් විශිෂ්ට ජයග්‍රහනයක් ලබා ගනු ඇතැයි පුරසාරම් දොඩා තිබේ.

ආර්ථිකය තව දුරටත් පිරිහීමට පෙර රාජපක්ෂ පසුගිය ඉරිදා පැවැත්වුනු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ (ශ්‍රීලනිප) සම්මේලනයේ දී 2011 වන තෙක් පැවැත්වීමට නියමිත නැති ජනාධිපතිවරනය කලින් පැවැත්වීම ගැන නිවේදනයක් කරනු ඇතැයි පුලුල් පරිමානව විශ්වාස කෙරිනි. කෙසේවෙතත් එය සිදු නොවුනි. පාර්ලිමේන්තු මැතිවරනය හෝ ජනාධිපතිවරනය යන දෙකෙන් එකක් වත් නිවේදනය කලේ නැත. එම තීන්දුව කවදා ගනු ඇති ද යන වග ද පැහැදිලි නැත. යලි බලයට පත්වීමට ඉටා ගෙන සිටින රාජපක්ෂ දැන් ජෙනරාල් ෆොන්සේකාගෙන් එල්ල විය හැකි අභියෝගයකට මුහුන දී සිටින්නේ, ආාන්ඩුවේ මැතිවරන ව්‍යාපාරය තුල ඇති එකම තුරුම්පුවට -- එනම්, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි මිලිටරි ජයග්‍රහනය ගැන පුරසාරම් දෙඩීමට -- වලකපමිනි.

විපක්ෂයේ "පොදු ජනාධිපති අපේක්ෂක" ලෙස ෆොන්සේකා තෝරාගැනීමේ හැකියාව විපාර්ශ්වික පක්ෂ -- ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ද එක්සත් ජාතික පක්ෂය (එජාප) නායකත්වයෙන් යුක්ත සන්ධානය ද -- මුහුන දෙන ගැඹුරු අර්බුදය ද අවධාරනය කරයි. පලාත් සභා මැතිවරනවල දි රාජපක්ෂ ලබාගත් ජයග්‍රහන බොහෝ සෙයින් කිසිදු සැබෑ විරුද්ධත්වයක් නැතිවීමේ ප්‍රතිඵලයක් විය. එජාප සහ ජවිපෙ යන දෙගොල්ලම, රාජපක්ෂගේ වර්ගවාදී යුද්ධයට ද මිලිටරියේ යුද අපරාධවල ද ඉන් අනතුරුව දෙමල සිවිල් වැසියන් 250,000ක් රඳවාගෙන සිටීමට ද ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ සෙසු පියවරයන්ට ද සහයෝගය දුනි. ආාන්ඩුවේ නාස්තිය හා දූෂනය හෙලාදකින අතරම. මෙම පක්ෂ දෙකම එහි වෙලඳ පොල-හිතැති දිශාවනිතය සහ ප්‍රතිව්‍යුහගතකරන පිලිවෙත් සමග එකගය.

එජාප සහ ජවිපෙ යන දෙපක්ෂයම දැන් පොදු ජනාධිපති අපේක්ෂකයකු ලෙස ෆොන්සේකාට ප්‍රසිද්ධියේ සහයෝගය ප්‍රකාශ කර තිබේ. තමන්ගේම නායකයන්ට රාජපක්ෂ පරාජය කල හැකි බවට මෙම එකදු පක්ෂයකට වත් විශ්වාසයක් නැත යන ඔවුන්ගේ තීන්දු මගින් අවධාරනය කෙරෙයි. එපමනක් නොව, දිගු කලක් තිස්සේ පවතින දක්ෂිනාංශික විපාර්ශ්වික පක්ෂය වන එජාප සහ 1960 ගනන්වල දී කලකිරුනු ග්‍රාමීය සිංහල තරුනයන් අතර ගරිල්ලා ව්‍යාපාරයක් ලෙස ගොඩනැගුනු සිංහල ජනතාවාදය සහ අන්තවාදය මත පදනම් වූ පක්ෂයක් වන ජවිපෙ අතර තියුනු මතභේද අඛන්ඩව පවතී. 2005 ජනාධිපතිවරනයේ දී ජවිපෙ එජාප නායක රනිල් වික්‍රමසිංහට එරෙහිව රාජපක්ෂට සහයෝගය දුන්නේ. 2002 දී එල්ටීටීඊය සමග සටන් විරාමය ගිවිසුමක් අත්සන් කිරීම හා සාම සාකච්ඡාවලට අවතීර්න වීම මගින් රට පාවාදුන් බවට වික්‍රමසිංහට චෝදනා කරමිනි.

විපාර්ශ්වික පක්ෂ ෆොන්සේකාට සහයෝගය දෙනු ඇති බවට කටකතා මාධ්‍යවල සති ගනනාවක් තිස්සේ පැතිරෙමින් තිබේ. ෆොන්සේකා, 2002 සටන් විරාමය විවෘතව උල්ලංඝනය කරමින් 2006 මැද දී දිවයින යලි යුද්ධයට ඇද දැමූ රාජපක්ෂ වටා සිටි දේශපාලන-මිලිටරි කට්ටුවේ කොටසක් විය. ඉහල ම හමුදා ජෙනරාල්වරයා ලෙස, ෆොන්සේකා. එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශවලට ඉවබවක් නැතිව වෙඩි හා බෝම්බ වරුෂා වැස්සවීම පිනිස මිලිටරියේ අතිමහත් ගුවන් හා කාලතුවක්කු සුපිරි බලය යොදාගනිමින් එල්ටීටීඊය සමූලඝාතනය කිරීමේ යුද්ධයක් ක්ෂමාවිරහිත ලෙස ගෙන ගියේය. ජනවාරි සිය මැයි දක්වා යුද්ධයේ අවසන් මාස කිහිපය තුල දී අඩු ගනනේ දෙමල සිවිල් වැසියන් 7,000ක් වත් ඝාතනය කෙරෙන්ට ඇතැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය තක්සේරු කරයි.

ෆොන්සේකා සහ රාජපක්ෂ අතර විරසකය මතුවීම ඇරඹුනේ එල්ටීටීඊයේ පරාජයෙන් ඉක්බිතිවය. ජනාධිපති රාජපක්ෂ සහ ඔහුගේ සොහොයුරු, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මිලිටරිය අත්පත් කරගත් ජයග්‍රහනය සඳහා හිමිකම් කීම ගැන මිලිටරි නිලධාරි තට්ටු තුල පවත්නා ගැඹුරට විහිඳුනු අසහනය එයට ආංශිකව හේතු වූ බව නිසැකය. ෆොන්සේකා නොවැම්බර් 13 දා සිය ඉල්ලා අස්වීම භාර දුන් අතර එය ක්ෂනිකවම පාහේ භාර ගැනුනි. ඔහු සිය සැලසුම් තවමත් නිවේදනය කර නැති මුත් සඳුදා ප්‍රවෘත්ති සාකච්ඡාවක දී ෆොන්සේකා ඇගවුම් කරමින් කියා සිටියේ "මට හැකි ඉහලම හැකියාවෙන්" තමන් දිගටම රටට සේවය කරන බවයි.

එජාපයේ, ජවිපයේ සහ ෆොන්සේකාගේ ම ක්ෂනික ගනන් බැලීම් මොනව වුවත්, රටේ ඉහලම ජෙනරාල් දේශපාලන වේදිකාවේ හරි මැදට පැමිනීම. වැඩෙන ආර්ථික හා දේශපාලනික අර්බුද හමුවේ රාජ්‍ය යන්ත්‍රයේ බලවේග මෙහෙයවනු පිනිස මිලිටරි බලවතකු වෙත ශ්‍රී ලංකා පාලක ප්‍රභූවේ කොටස්වල පැහැදිලි හැරීමක් සලකුනු කරයි.

දශක දෙකකට අධික කලක් තිස්සේ පැවති යුද්ධය, ආර්ථික කලබගැනි සහ ගැඹුරු වන සමාජ අසමානතාව සියලු ප්‍රධාන පක්ෂ කෙරෙහි පුලුල්ව පැතිරුනු මහජන වෛරය, පිලිකුල සහ විරුද්ධත්වය කරා තුඩු දී තිබේ. ආන්ඩුවේ සෑම මන්ත්‍රීවරයකුටම පාහේ ඇමති හෝ උපදේශක තනතුරක් දීම මගින් යන්තම් අටවා ගෙන සිටින අස්ථාවර සන්ධානයක් මත රාජපක්ෂ වාරු වී සිටී. විපාර්ශ්වයේ පක්ෂ ද ඊට නොඅඩු ලෙස භේද හා ආතතීන් මගින් ඉරිතලා තිබේ. 1990 ගනන්වල දී ප්‍රයෝජනවත් දේශපාලන ආරක්ෂක කපාටයක් ලෙස ක්‍රියාත්මක වූ ජවිපෙ, 2004 දී ශ්‍රීලනිප සභාගයකට එකතු වීම හේතු කොටගෙන ඉක්මනින්ම අපකීර්තියට පත්විය. මේ වසර මුල දී එම පක්ෂය භේද වූයේ එහි පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගෙන් බොහෝ දෙනෙක් ආන්ඩුවට එකතු වෙමිනි.

රට එක් දේශපාලන අර්බුදයකින් තවත් දේශපාලන අර්බුදයකට ඇද වැටී ඇති තතු තුල, එයින් කුපිත වූ මාධ්‍ය අටුවාකරුවන් පාර්ලිමේන්තු කලහයන් නතර කොට අවශ්‍ය දැඩි පියවර පැනවීම හා මොන යම් හෝ විරුද්ධත්වයක් මර්දනයේ ගල් රෝලට යට කොට තලා දැමීම මගින් රට බේරා ගනු පිනිස බලවතකුගේ මැදිහත්වීම ඉල්ලා සිට ඇත්තේ වරක් දෙවරක් නොවේ. බොනපාට්වාදියකු සඳහා වූ කැඳවුමට මේ අවස්ථාවේ ප්‍රතිචාර ලැබී ඇත්තේ 1930 ගනන්වලින් මෙපිට පැවති ගැඹුරුතම ගෝලීය ආර්ථික අර්බුදය මධ්‍යයේ වීම අහම්බයක් නොවේ.

යුද අපරාධ, ඝාතක කල්ලිවල මෙහෙයුම් හා සෙසු මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් රාජපක්ෂ සමග සෘජුවම වගකිව යුතු වූ ෆොන්සේකාට අලුත් "ප්‍රජාතන්ත්‍රවාදී" සලුපිලි ඇන්දවීමේ ප්‍රයත්නයක විපාර්ශ්වික පක්ෂ යෙදී සිටී. එජාප නායක රනිල් වික්‍රමසිංහ හා සෙසු විපක්ෂ නායකයන් සමග පැවති රහස් සාකච්ඡාවන්හි දී නොවැම්බර් 6 දා කෙටුම්පත් කරන ලදැයි වාර්තා වන ෆොන්සේකාගේ ඉල්ලා අස්වීමේ ලිපිය ද එයට ෆොන්සේකා විසින් ම පසුව කරන ලද සංශෝධන ද පිලිබඳ දීර්ඝ විවරනයක් පසුගිය සති අන්තයේ *සන්ඩේ ටයිම්ස්* පත්‍රයේ පල විය.

*සන්ඩේ ටයිම්ස්* පත්‍රයට අනුව, ඉල්ලා අස්වීමේ ලිපියට සම්බන්ධිත ඇමිනුමක් ෆොන්සේකා දේශපාලනිකව රාජපක්ෂට විරුද්ධ මන්ද යන්න පිලිබඳ හේතු 16ක් පෙල ගස්වයි. විපාර්ශ්වික පක්ෂ විසින් පිලියෙල කරන ලද ලියවිල්ලේ 13 වන කාරනයේ දී ෆොන්සේකා ප්‍රකාශ කලේ, මිලිටරිය විසින් පවත්වා ගෙන යනු ලබන "රැඳවුම් කඳවුරුවල රඳවා සිටින දෙමල සිවිල් ජනයාගේ ඉරනම" මා හට ඉතා කනස්සල්ල දෙන ගෙන කරුනක් " බවයි. ආන්ඩුවට නිසි සැලසුම්කරනයක් නොමැති බවට විවේචනය කරන ඇමිනුම, රටේ අන් ප්‍රදේශවල මිතුරන් හා ඥාතීන් සිටින රැඳවියන්ට ඔවුන් සමග ජීවත් වීමට ඉඩ දිය යුතු යයි ඉල්ලා සිටියේය.

15 වන කාරනාව, "දෙමල ජනයාගේ සිත් දිනාගැනීමේ පැහැදිලි ප්‍රතිපත්තියක් නොමැති නිසා, ලබාගත් ජයග්‍රහනය විනාශ වන හා අනාගතයේ දී තවත් නැගීසිටීමක් සිදු වීමේ තත්වයකට පැමින" තිබීම් සම්බන්ධයෙන් ආන්ඩුව විවේචනය කලේය. 16 වන කාරනය මෙසේ වැලපෙයිඃ "යුද්ධය අවසානයේ සමස්ත රටම බලාපොරොත්තු වූ සාමයේ ප්‍රතිලාභ තවමත් ලැබී නොමැත. ජනතාව මුහුන පා සිටින ආර්ථික දුෂ්කරතා වැඩි වී ඇති අතර, නාස්තිය හා දූෂනය ඉහවහා ගොස් තිබේ. මාධ්‍ය නිදහස හා අනෙකුත් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මර්දනයට ලක්වෙමින් තිබේ."

මහජන අසන්තෘප්තියට ආයාචනා කිරීමට සැලසුම් කෙරුනු මෙම සීමිත විවේචනවල එල්ලය වන්නේ, විපාර්ශ්වික පක්ෂ, රටේ ව්‍යවස්ථාව හා නෛතික පද්ධතිය විවෘතව උල්ලංඝනය කරමින් මිලියන කාර්තුවක් පමන වන පුරවැසියන් සංඛ්‍යාවක් හිතුවක්කාරී ලෙස රඳවා තබා ගැනීමට ද ජනාධිපතිට පුලුල් ප්‍රජාතන්ත්‍ර විරෝධී බලතල ලබා දෙන වත්මන් හදිසි නීතියට ද දිගටම සහාය දෙන අතර වැඩ කරන ජනතාව මුහුන දෙන දුෂ්කරතා තව දුරටත් දරුනු කරන ආර්ථික පිලිවෙත් ඉදිරිපත් කරන්නේ ය යන කාරනාව යට ගැසීමයි.

කෙසේවෙතත්, ෆොන්සේකා භාර දුන් ලිපියේ ඒ එක කාරනාවක් වත් තිබුනේ නැත. ඔහුගේ අවසන් ඉල්ලා අස්වීමේ ලිපිය 16 වන කාරනාව ඉවත් කර තිබුනේ, ප්‍රජාතන්ත්‍ර අයිතීන් පිලිබඳ ඔහුගේ පරිපූර්න පිලිකුල අවධාරනය කරමිනි. මිලිටරිය පිලිබඳ ඇල් මැරුනු මාධ්‍ය විවේචන පවා "දේශද්‍රෝහී" ලෙස හෙලාදැකීම පිලිබඳ ෆොන්සේකාගේ වාර්තාව ප්‍රසිද්ධ එකකි. යුද්ධයේ කාල පරිච්ඡේදය තුල දී, ආරක්ෂක හමුදාවල සහයෝගිතවා සහිතව ක්‍රියාත්මක වූ ආන්ඩු-ගැති ඝාතක කල්ලි විසින් මාධ්‍යවේදීන් ගනනාවක් ම පැහැරගැනීමට හා ඝාතනයට ලක් කෙරුනි.

ඔහුගේ නායකත්වය යටතේ පිහිටුවන ලද රැඳවුම් කඳවුරු සම්බන්ධයෙන් ගත හොත්, රැඳවියන්ට පිටව යාමට ඉඩදීම පිලිබඳ සියලු සැඳහුම් ඉවත් කල ෆොන්සේකා, ඒ වෙනුවට, "නිසි යටිතල පහසුකම් නොමැතිව වේලාව පිරිමසා ගන්නා ආකාරයට" ඔවුන් යලි පදිංචි කිරීම ගැන ආන්ඩුව විවේචනය කලේය. කිසිසේත්ම රැඳවුම් පිලිවෙත හෙලාදැකීමක් නොකල ඔහු, එය යුක්තියුක්ත කරන නිල තුනී කඩතුරාව පුනරුච්චාරනය කලේයඃ "විනිවිඳ ඇති (එල්ටීටීඊ) ත්‍රස්තවාදීන්" හඳුනාගැනීම ද බිම් බෝම්බ ඉවත් කිරීම සම්පූර්න කිරීමට ඉඩ දීම ද අවශ්‍ය ය.

දිවයිනේ දෙමල සුලුතරයේ "සිත් දිනාගැනීමේ" පිලිවෙතක් වෙනුවට, ෆොන්සේකා ඉල්ලා සිටින්නේ, "ආරක්ෂාව සැපයීමේ" මුවාවෙන් පැවති එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවල නිත්‍ය මිලිටරි වාඩිලෑම ශක්තිමක් කිරීමකි. ඔහුගේ ලිපිය මෙසේ සඳහන් කලේයඃ "දෙමල ජනතාවගේ ආරක්ෂාව සහතික කිරීමේ පැහැදිලි පිලිවෙතක් නැත. එය ලබාගත් ජයග්‍රහන විනාශවීමට ඉඩ සලසන අතර යලි පදිංචි කල ප්‍රදේශවල ආරක්ෂක වැඩපිලිවෙලක් නැතිකම නිසා අනාගතයේ දී තවත් නැඟීසිටීමක් සඳහා මාවත සකසා ඇත."

ෆොන්සේකාගේ ලිපියේ කේන්ද්‍රීය කාරනාව වන්නේ, එල්ටීටීඊය පරාජය කිරීමෙහිලා මිලිටරියේ ද ඔහුගේ ම ද ක්‍රියාකලාපය දේශපාලනිකව ආරක්ෂා කිරීමයි. "මෙම විශිෂ්ට කර්තව්‍යය (යුද්ධය ජයගැනීම) සාක්ෂාත් කරගත හැකි වූයේ මා ලබාදුන් දර්ශනය, නායකත්වය හා ප්‍රධානත්වය හේතුවෙනි" යයි ඔහු ලිවීය. රට තවත් මියන්මාර් දේශයක් බවට පත් කරනු ඇති "ඕනෑවට වඩා බලසම්පන්න යුද හමුදාවක් රටට තිබෙන බවට ජනමතයක් ගොඩනැගෙමින් පවතින්" බවට රාජපක්ෂ කලා යයි කියන ප්‍රකාශ පිලිබඳව ඔහු විවේචනශීලී විය.

එලඹෙන හමුදා කුමන්ත්‍රනයක තර්ජනය පිලිබඳව ඔක්තෝබර් 15 දා ඉන්දියාවට විමසිල්ලෙන් සිටින ලෙසට අනතුරු ඇඟවූ බවට ද ලිපිය රාජපක්ෂව විවේචනය කරයි. රාජපක්ෂ ඉන්දියාවට එසේ අනතුරු ඇඟවූයේ ද නැද්ද යන වග පැහැදිලි නැත. නව දිල්ලිය ෆොන්සේකාගේ ප්‍රකාශය ප්‍රතික්ෂේප කර ඇත. එහෙත් ඔහුගේ ආන්ඩුවේ සහායෙන් නිර්මානය කෙරුනු දැවැන්ත හමුදාවෙන් එල්ල විය හැකි අභියෝග සම්බන්ධයෙන් රාජපක්ෂ නොසන්සුන්ව සිටින බව නිසැකය.

ෆොන්සේකා දේහානුරූප කරන්නේ, මිලිටරිය දේශපාලන ජීවිතය තුල වැඩිවැඩියෙන් සිදු කර ඇති ඍජු කාර්යභාරයයි. රාජපක්ෂගේ ජනාධිපති කට්ටුවේ කොටසක් ලෙස, ඔහු ආන්ඩුවේ පිලිවෙත තීන්දු කිරීමට සහාය දුන් අතර ඔහුගේ ම දේශපාලන ප්‍රකාශ ද සිදු කලේය. ෆොන්සේකා හිටි අඩියේ ම ඉල්ලා අස්වී ජනාධිපති තනතුර ගැන උනන්දුව සිටී යන කරුන වනාහි, බලගතු මිලිටරි යාන්ත්‍රනය යුද්ධයේ අවසානයෙන් පසුව සිය බලය හා වරප්‍රසාද පවත්වා ගෙන යාම පිලිබඳ අභිප්‍රායෙන් පෙලෙන බවට සලකුනකි.

ෆොන්සේකාගේ අභිප්‍රායන් මොනවා වුවත්, පාලක ප්‍රභූවේ කොටස් රටේ බලගතු විධායක ජනාධිපති තනතුර සඳහා සිවිල් ඇඳුමෙන් සිටින මෙම ජෙනරාල්වරයාට සහයෝගය දෙන්නේ, තමන්ගේ ම අරමුනු පෙරදැරි කරගෙනය. වසර 26ක් තිස්සේ කොලඹ දේශපාලන සංස්ථාපිතය වැඩ කරන ජනතාව අතර වාර්ගික භේද වැපිරීම ද සිය ප්‍රතිගාමී ආර්ථික පිලිවෙත්වලට එල්ල වන විරුද්ධත්වය මැඩීම ද පිනිස යුද්ධය ගසාකා තිබේ. එය දැන් මුහුන දී සිටින්නේ, තව දුරටත් දරුනු වන හා පුලුල්ව පැතිරුනු සමාජ අසහනයට තුඩු දෙනු ඇති ප්‍රගාඪ ආර්ථික අර්බුදයකටය. වැටුප් වැඩිවීමක් ඉල්ලමින් කම්කරුවන්ගේ සැලකිය යුතු කොටසක් අතර දැනටමත් වර්ජන ව්‍යාපාරයක් වර්ධනය වෙමින් පවතින්නේ, එය පාලනය කොට කඩාකප්පල් කිරීමේ වෘත්තීය සමිතිවල ප්‍රයත්නය ද නොතකාය.

ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලබා දෙන ආර්ථික සහයෝගය ආරක්ෂා කරමින්, එහි කලමනාකරන අධ්‍යක්ෂ ස්ට්‍රාව්ස් ඛාන් නොවැම්බර් 5 දා හියුමන් රයිට්ස් වොච් සංවිධානයට ලියූ ලිපිය මගින් අර්බුදයේ ගැඹුර අවධාරනය කෙරෙයි. "ශ්‍රී ලංකාවේ ආර්ථිකය මුහුන දී සිටින්නේ බැරෑරුම් අර්බුදයකට ය. එම රටේ මානව හිමිකම් තත්වය පිලිබඳ කෙනෙක් දරන මතය කුමක් වුවත්, ආර්ථිකයේ කඩාවැටීම සාධාරන ප්‍රතිඵලයක් ලෙස සැලකිය නොහැකිය." යයි ඔහු ලිවීය. "අපගේ කාර්යභාරය වන්නේ, . . . කඩාවැටීමක් වලක්වා ගැනීමට හැකි සෑම දෙයක්ම කිරීම ය. එවන් කඩාවැටීමක ප්‍රතිඵල මහජනතාව සඳහා ව්‍යසනකාරී වනු ඇත. විශේෂයෙන් ම ජනගහනයේ දුප්පත්ම කොටස් සඳහා එය එසේ වනු ඇත."

මෙම එලඹෙන සමාජ පිපිරීමට මුහුන දෙන තතු තුල, ෆොන්සේකා වෙත හැරීම පිලිබිඹු කරන්නේ, අන් සියල්ලටමත් වඩා, කම්කරු පන්තිය සමග ගැටුමක දී අවශ්‍ය ක්ෂමාවිරහිත පිලිවෙත් ගෙනයාමට රාජපක්ෂ තන්ත්‍රය අපොහොසත් බවට පාලක පන්තිය තුල පවත්නා භීතියයි.

© www.wsws.org